**අම්බලන්ගොඩ නගර සභාව.**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 16 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 වන දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයේදී වැසි ජල කාණු පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය රු.12,142,439 ක් හා ඊට අදාළ පොලිය රු.10,707,125 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,940,274 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| (i) ප්‍රධාන ලේකම්ගේ අංක CSS/9/2/5 දරන හා 2020 පෙබරවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ යටතේ වූ ලැබියයුතු ශේෂ පිළිවෙලින් රු. 37,991,599 ක් හා රු. 448,838 ක් ද වැඩියෙන් දැක්වුණි. | ශේෂ හඳුනා ගෙන නිවැරදි කර වාර්තා කළ යුතුවේ. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) වසර 21 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.16,688,128 ක්වූ ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ හඳුනා ගෙන නිවැරදි කර වාර්තා කළ යුතුවේ. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| වසර 25 ක සිට ඉදිරියට එන එකතුව රු. 10,645,572 ක් වූ ගෙවිය යුතු ශේෂ 09 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.469,182 ක් වූ ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලාශ්‍ර ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගරසභා අණ්ඩා පනත | | | |
| | 170 (1) (2) වගන්තිය | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | වරිපනම් සඳහා ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 395 (ඇ) | සභාවේ විදුලි බැංකු ගිණුම හා පරිසර ව්‍යාපෘති ගිණුම සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වසර 02 ක කාලයක් ඉක්ම වූ මිශ්‍ර තැන්පතු ශේෂ 39 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,759,085 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,909,490 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 12,375,000 | 20,360,801 | 18,893,201 | 24,625,798 | 14,525,000 | 20,497,155 | 17,444,732 | 23,681,395 |
| කුලී | 14,466,600 | 11,375,205 | 11,359,818 | 4,427,913 | 14,197,000 | 9,186,693 | 8,884,771 | 13,182,082 |
| බලපත්‍ර ගාස්තු | 852,000 | 791,524 | 689,941 | 957,453 | 252,500 | 1,111,819 | 1,090,119 | 606,507 |
| වෙනත් ආදායම් | 125,222,477 | 34,232,828 | 38,191,183 | 60,889,306 | 114,777,933 | 95,262,346 | 134,187,365 | 86,163,590 |
| | 152,916,077 | 66,760,358 | 69,134,143 | 90,900,470 | 143,752,433 | 126,058,013 | 161,606,987 | 123,633,574 |

### 2.2.2 කුලී ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/2010/01 චක්‍රලේඛයේ 05 වන වගන්තිය පරිදි සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවද, බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 31 ක් වෙනුවෙන් වූ ගිවිසුම් සඳහා අවුරුදු 09 සිට අවුරුදු 17 දක්වා කාලයක් ගත වී තිබුණි. චක්‍රලේඛයේ 06 වන වගන්තිය ප්‍රකාරව වසර 05 කට වරක් තක්සේරු ගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ලේකම්ගේ අංක CSS/9/2/5 දරන හා 2020 පෙබරවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු. 21,360,332 ක් හා රු.620,620 ක් වූ නමුත්, මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු. 59,351,931 හා රු.1,069,458 ලෙස දක්වා තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම පනවා තිබූ අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2016-2019 සහභාගීත්ව සිව් අවුරුදු සැලැස්ම අනුව පිළියෙල කළ 2019 වාර්ෂික සැලැස්මේ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 13 ක වටිනාකම් එකතුව රු.85,085,000 ක් වූ කර්මාන්ත 82 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. සභාව විසින් සැලැස්මට අයත් ගිවිසුම්ගත එකතු වටිනාකම රු.1,509,941 ක් වූ කර්මාන්ත 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සියයට 04 ක් විය. | වාර්ෂික සැලැස්මට අනුව කර්මාන්ත අවසන් කළ යුතුවේ. | ඉදිරියේ දී එසේ කටයුතු කරමි. |

#### (ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/33 දරන අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කළ ගැසට් නිවේදනය අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ඒකකයක් ස්ථාපනය කර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දිගු කාලීන සැලැසුම් සකස් කර නොතිබුණි. | කසල කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට ලැබියයුතු වීථි පහන් නඩත්තු මුදල් ලැබී නොතිබුණු අතර, ඉකුත් වර්ෂ 03 දී සභාව විසින් දැරූ රු.5,365,341 ක් වූ නඩත්තු වියදම ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සේවකයකුට අදාළ විශ්‍රාම වැටුප් අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු. 148,760 ක් මිශ්‍ර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිවැරදි ලේඛනවල සටහන් කළ යුතුවේ. | ලේඛන නිවැරදි කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| (i) | මාණ්ඩලික මට්ටමේ තනතුරක් තෘතීයික මට්ටමේ තනතුරු 12 ක හා ද්විතීයික මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | ප්‍රජා සංවර්ධන නිලධාරි හා තොරතුරු තාක්ෂණ නිලධාරී අනුමත තනතුරක් නොවූවද නිලධාරීන් දෙදෙනෙකු සේවය සඳහා අනුයුක්ත කර තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | අනියම් සේවකයින් 51 ක් සේවයේ යෙදී සිටි අතර ඔවුන්ගේ සේවය ස්ථිර කර අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ තනතුරු විධිමත් කර ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**(ආ) සේවක ණය**

| | | |
|---|---|---|
| ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවය හැරගිය සේවකයින් 73 ගෙන් අය විය යුතු සේවක ණය රු.475,450 ක් වී තිබුණද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ සේවකයින්ගේ ඇපකරුවන් ගෙන් අයකර ගත යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් කාර්යක්ෂමතා

**හානි හා පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ ගබඩා භාණ්ඩ සමීක්ෂණය අනුව භාණ්ඩ අයිතම 220 ක භාණ්ඩ ඒකක 9007 ක ඌණතාවයක් අනාවරණය වී තිබුණි. ගබඩාව භාණ්ඩ ලැබීම හා නිකුත් කිරීම් විධිමත්ව සටහන් කර නොතිබුණ අතර, ලේඛන නඩත්තු කිරීම ද දුර්වල තත්ත්වයක පැවතුණි. තවද ගබඩාවේ කටයුතු සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයක් ද සිදු වී නොතිබුණි. | ගබඩා ලිපි ලේඛන විධිමත් පරිදි නඩත්තු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කැබලි කිරීමේ යන්ත්‍රයක් වසර කිහිපයක සිට දිරාපත් වෙමින් පැවති අතර, ප්‍රයෝජනයට ගැනීමට හෝ ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

## 3.6 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී පිළියෙල කිරීමට කටයුතු කරමි. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

**විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සිදු කළ ද සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |